**මන්නාරම නගර සභාව**

**---------------------------**

**මන්නාරම දිස්ත්‍රික්කය**

**------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-----------------------------------

2018 වර්ෂයේ මූල්‍යප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍යප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් **31** දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මන්නාරම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ලෙජරයේ ගෘහ භාණ්ඩ හා උපකරණවල ආරම්භක ශේෂය රු. 2,010,947 ක් සහ 1,103,840 ක් අඩු කර පෙන්වා ඇත. | ආරම්භක ශේෂයන් මාරු කිරීමේදී නිවැරදි අගය මාරු කළ යුතුය. | ඉදිරි කාලයේදී නිවැරදි අගය මාරු කරනු ලැබේ. |

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම්** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|---|
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| | **මුදල් රෙගුලාසි 371** | **අවස්ථා 12 කදී වසර හයකට වඩා වැඩි කාලයක විවිධ ක්‍රියාකාරකම් සඳහා** ගෙවන ලද එකතුව **රු. 1,678,168 ක** අත්තිකාරම් **නිරවුල්** ලෙස කටයුතු කර නොතිබුණි. | **මුදල් රෙගුලාසි ප්‍රකාරව පියවර ගත යුතුයි.** | අත්තිකාරම් නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය** **--**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,153,708 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමරු.12,896,803 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාවේ හිඟ ආදායම පසුගිය වර්ෂයේ රු.19,212,864 ක් වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ තථ්‍ය මුළු හිඟය රු.24,177,195 වීම හේතුවෙන් රු.4,964,331 ක වර්ධනය වීම ආදායම් රැස්කිරීමේ අකාර්යක්ෂමතාවයක් ලෙස නිරීක්ෂණය විය.

* බිල් කළ ආදායම **විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.**

| ආදායම් ප්‍රභවය | 2018<br>ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | 2017.12.31 දිනට මුළු හිඟය | 2017<br>ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | 2017.12.31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| වරිපනම් හා බදු | 17,055,000 | - | 18,329,289 | 18,867,241 | 17,080,000 | - | 18,304,367 | 1,244,367 |
| කුලී | 28,269,300 | - | 37,065,155 | 5,309,954 | 22,309,300 | - | 30,760,213 | 8,450,913 |
| බලපත්‍ර ගාස්තු | 1,340,000 | - | 1,422,159 | - | 1,010,000 | - | 1,240,841 | 230,841 |
| වෙනත් ආදායම් | 18,086,500 | - | 26,508,501 | - | 11,987,250 | - | 21,273,993 | 9,286,743 |
| | | - | | | | - | | |
| එකතුව | **64,750,800** | - | **83,325,104** | **24,177,195** | **52,386,550** | | **71,599,414** | **19,212,864** |
| | ===== | ===== | ===== | ===== | ===== | ====== | ===== | ====== |

**2.2.2 වරිපනම්**

**-------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වරිපනම් බදු හිඟය රු.16,194,671 වූ අතර, එම මුදල් අය කිරීමට සභාව විසින් ඵලදායී ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | හිඟ **වරිපනම්** අයකර ගැනීමට පියවර ගත යුතු වේ**.** | හිඟ **වරිපනම්** අයකර ගැනීමට පියවර ගෙන ඇත. |

**2.2.3 කුලී**

**--------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හිඟ කුලී එකතුව රු.4,089,621ක් එම මුදල් අය කිරීමට ඵලදායී ලෙස කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී ශේෂ අය කිරීමට කටයුතු කළ යුතුය | හිඟ කුලී ශේෂ අය කිරීමට පියවර ගෙන ඇත. |

**2.2.4** උසාවි දඩ හා මුද්දර ගාස්තු

**( අ )** උසාවි දඩ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ සහ අනෙකුත් නිලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 වන දිනට අයවිය යුතු උසාවි දඩ මුදල් ශේෂය රු.4,743,854 කි. | උසාවි දඩ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අය කිරීමට පියවර ගෙන ඇත. |

**(ආ )** මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ නිලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 වන දිනට රු.18,806,794 ක මුද්දර ගාස්තු අයකළ යුතුව තිබුණි. | **මුද්දර ගාස්තු** අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ **මුද්දර ගාස්තු** අය කිරීමට පියවර ගෙන ඇත. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කාර්ය සාධනය**

**තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අප්‍රේල් 23 වන දිනැති අංක පොදු/2018/61 දරන විගණන ලේකම් කාර්යාලයේ චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධනයට වෙරළාශ්‍රිත සම්පත් ආරක්ෂා කළ යුතු අතර තිරසාර ලෙස දැනුවත් කිරීම් කටයුතු සහ සමුද්‍රීය සහ වෙරළාශ්‍රිත දූෂණය පාලනය කිරීමේ සැලසුම් කිසිවක් පිළියෙල කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟාවීමට වෙරළාශ්‍රිත සම්පත් **සංරක්ෂණය** කළ යුතු වේ. | වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව සමඟ එක් වී පල්ලිමුනෙයි වෙරළ ප්‍රදේශය සහ කීරි වෙරළ ප්‍රදේශවල ශ්‍රමදාන සිදු කරනු ලැබේ. එමෙන්ම වෙරළට සම්බන්ධ වන ප්‍රධාන අපජල කාණු පද්ධතියේ කම්බි දැල් ආවරණයක් සකසා පොලිතීන් සහ ප්ලාස්ටික් භාණ්ඩ මුහුදට යෑම වැලැක්වීමට වැඩපිළිවෙලක් සකස් කිරීමට ඇස්තමේන්තු පිළියෙල කර ඇත. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මහජනතාවගෙන් ලද පැමිණිලි 97 ක් සම්බන්ධයෙන් සභාව විසින් ඵලදායී ලෙස කටයුතු සිදු කර නොතිබුණි. | ලැබුණු පැමිණිලිවලට සභාව විසින් විසඳුම් ලබාදිය යුතුයි. | 2018 වර්ෂයේ මහජනතාවගෙන් ලද පැමිණිලිවල විෂයයන් 58 ක් නිරාකරණය කළ යුතුව තිබුණි. මෙයින් සමහර විෂයයන් වාචිකව එකඟතාවයට පැමිණ තිබුණි. තවද, නීතිවිරෝධී ගොඩනැගිලි සම්බන්ධව නීතිමය පියවර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට බලය ඉල්ලුම් කිරීමේ ලිපි යවා ඇත. අනුමැතිය ලැබුණු විට අදාළ කටයුතු කරනු ලැබේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 වන දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 109 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 100 ක් වී තිබුණු අතර සභාවේ පුරප්පාඩු 09 ක් පවතින බව නිරීක්ෂණය විය. | පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ යුතුයි. | නගර සභාවට අයත් ලැයිස්තුගත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 06 ක් පිරවීම සඳහා වූ ඉල්ලීම් ලිපි උතුරු පළාතේ පරිපාලන නියෝජ්‍ය ලේකම් වෙත යවා ඇත. තවද, ලැයිස්තුගත නොකළ කාර්ය මණ්ඩලය සඳහා වූ පුරප්පාඩු 03 ක් පිරවීමට නාගරික කොමසාරිස්වරයාගෙන් අනුමැතිය ඉල්ලා ඇත. |

**3.4**

**වත්කම් කළමනාකරණය**

--------------------------

**3.4.1 නඩත්තු සහ අලුත්වැඩියා කිරීමට අපොහොසත් වීම**

----------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් උපයෝජනයට නොගන්නා වාහන 24 ක් පිළිබඳ කටයුතු කර නොතිබුණි. | වාහන උපයෝජන කිරීමට කටයුතු කළ යුතුය. | අදාළ වාහන 24 ක අලුත්වැඩියා කර භාවිතා කළ හැකි වාහන, අලුත්වැඩියා කර භාවිතා කරනු ලබන අතර අලුත්වැඩියා කළ නොහැකි අනෙකුත් වාහන භාවිතයෙන් ඉවත් කිරීමට කටයුතු සිදු කර ඇත. |

### 3.4.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව විසින් භාවිතයට ගන්නා ලද සභාවට රු.17,613,000 ක් වටිනා වාහන 14 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කළ නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | වාහන 14 ක අයිතිය පවරා ගැනීමට පියවර ගෙන තිබුණි. |
| (ආ) | සභාව විසින් භාවිතයට ගන්නා රු.31,100,000 ක් වටිනා ගොඩනැගිලි 03 ක් ඉදිකර ඇති ඉඩම්වල අයිතිය සභාවට පවරා ගැනීමට ඵලදායී පියවර ගෙන නොතිබුණි. | ඉඩම්වල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුයි. | එම ඉඩම්වල ඔප්පු සනාථ කිරීම සඳහා මන්නාරම ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. |

## 4 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාවේ අයවැයගත වියදම් රු.88,010,500 ක් වූ අතර තථ්‍ය වියදම් රු.71,621,015 ක් විය. | අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර විශාල වෙනස්කම් ඇති නොවන ලෙස අයවැය ලේඛනය පිළියෙල කළ යුතුයි. | 2018 වර්ෂයේ අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර වූ වෙනස්කම් පිළිබඳව ඉදිරි වර්ෂයේ අදාළ වියදම් පිළිබඳ අයවැය සකස් කිරීමේදී අයවැයගත සහ තථ්‍ය වියදම් අතර වූ වෙනස අඩු කිරීම සඳහා අවධානය යොමු කර ඇත. |